# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,134 - 2019 ජූලි මස 26 වැනි සිකුරාදා - 2019.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා බඳවා ගැනීම**

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු 01ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණුදීමේ පරිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :-

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද* :
ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු නීතිඥයකු වශයෙන් සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිළිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.);

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03කට නොඅඩු පහත දක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම.

(1) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම,
(2) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු,
(3) අදාළ අණපනත් සම්බන්ධ නෛතික කටයුතු,
(4) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු,
(5) විවිධ ආයතනවලින් පවත්වනු ලබන නීති කටයුතුවලට අදළ පරීක්ෂණ සම්බන්ධ කටයුතු,
(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) *වෙනත් සුදුසුකම්* :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය,
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය,
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය.
තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2014.01.21 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත්වී වසර පහක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේක අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව* :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630- 17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක SL-1-2016 වැටුප් කාණ්ඩය වේ.) ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. :-

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | ***අතිරේක අධ්‍යාපන සුදුසුකම්* :** | | **25** |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද ක්ෂේත්‍රයට අදළ පශ්චාත් උපාධිය | 25 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) | 20 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | ● පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | ● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | ● දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 05 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 05 | |
| | *සටහන* : ගෞරව සාමාර්ථයක් සමඟ අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 05ක් ලබා දිය යුතුයි.<br>(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබාදේ.) | | |
| 02 | ***අතිරේක වෘත්තීය පළපුරුද්ද* :** | | 35 |
| | I. *අතිරේක වෘත්තීය සුදුසුකම්* -<br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට වැඩි ඩිප්ලෝමාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 10 බැගින්) | 10 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 05 බැගින්) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට වැඩි හා මාස 06කට අඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින්) (අංක 01 යටතේවන ලකුණු ලබාදුන් සහතික හැර වෙනත්) | | |
| | II. *අතිරේක පළපුරුද්ද* -<br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද<br>එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25ක් මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02<br>(මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍යවන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර).<br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයකුගෙන් හෝ විනිසුරුවරයෙකුගෙන් හෝ ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | 25 | |
| | ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් සඳහා ආයතන ප්‍රධානී විසින් අතිරේක පළපුරුද්ද සනාථ කිරීමේ දී අයදුම්කරු නීතිමය තනතුරක සේවය කරන බවට සේවා සහතිකයක්/සහතිකපත් මගින් සනාථ කළ යුතුය.) | | |
| 03 | ***තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම* :** | | **10** |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 07 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | මාස 06/පැය 720 | 05 | |
| | මාස 03/පැය 360 | 03 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.) | | |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අගෝස්තු මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අගෝස්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04 | *භාෂා ප්‍රවීණතාවය* | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාල විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය) | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | මාස 06/පැය 720 | 07 | |
| | මාස 03/පැය 360 | 05 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.) | | |
| 05 | *සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය* | | 15 |
| | i. සාමාන්‍ය දැනීම හා බුද්ධිය | 05 | |
| | ii. නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම | 05 | |
| | iii. පැහැදිලි අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | 05 | |
| | එකතුව | | 100 |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :-

(i) අයදුම්පත් 2019 අගෝස්තු 26 දිනට හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
සමාගම් මැදුර, අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

(ii) ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1.1 සිට 5.1 දක්වාත් දෙවැනි පිටුව 5.2 සිට 7 දක්වාත් තෙවැනි පිටුව 8 සිට 9 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 47,615 කට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :-
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන්
නැවත පදිංචි කිරීම සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු
හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

2019 ජූලි මස 11 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව***

*විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2019*
Category Structured Interview for Recruitment to the post of Legal officer of Executive Service
Category Grade III - 2019

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

(1) 1.1සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා : HERATH MUDIYANSALAGE SAMAN KUMARA GUNAWARDENA)

1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා : GUNAWARDENA H.M.S.K.)

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(2) 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(3) 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 [ ] පුරුෂ - 0 [ ]

(අදාල අංකය කොටුව තුල ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

3.3 2019.08.26 දිනට වයස :

අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

3.4 දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(4) 4.1 අධ්‍යාපන සුදුසුකම් :
උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමට අදාළ වූ අධ්‍යාපන සහතික පිළිබඳ විස්තර සහ එය පිරිනැමූ දිනය :
(i) විශ්වවිද්‍යාලය හෝ ආයතනය :————.
(ii) උපාධිය හෝ අධ්‍යාපන සහතිකයේ නම :————.
(iii) උපාධිය හෝ අධ්‍යාපන සහතිකය වලංගු වන දිනය :————.
(iv) පන්තිය :————.

5.0 නීති ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද :————.

6.0 පරිගණක ක්ෂේත්‍රයේ පළපුරුද්ද :————.

7.0 වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

8.0 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :————.

9.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද : (අදාළ කොටුවේ හරි ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් [ ] නැත [ ]
..........................................................................................................
..........................................................................................................

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලු කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

————.
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

12.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .......................................................................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................ ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

07-956

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(II)2019**

1.0 2013.12.11 දිනැති හා අංක 1840/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8 ඡේදය, 15 ඡේදය අන්තර්කාලීන විධිවිධාන සහ ඇමුණුම 05 හි විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 (i) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාවේ, II පන්තියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකරන ලද එහෙත් මෙම විභාගයෙහි (1) කාර්යාල ක්‍රම හා කාර්ය පටිපාටිය (2) රජයේ කාර්යාලවල භාවිතා වන ගිණුම් ක්‍රම යන විෂයයන් එකක් හෝ දෙකම සමත් වූ හෝ නිදහස් කරන ලද නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාවෙහි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙහි අදාළ විෂයයන්ගෙන් විෂයයෙන් විෂයයට පදනම මත නිදහස් කරනු ලැබේ.

(ii) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර II ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන් ඔවුන් II ශ්‍රේණියට උසස්වී වසර හයක් (06) ගතවීමට පෙර II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

3.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහතින් දක්වේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අයදුම්කරුවන්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ. අයදුම්පතේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතු වේ. අයදුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුරය | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුර | 13 |
| කිලිනොච්චිය | 14 |

4.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

(ii) අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

5.0 *සුදුසුකම්* .- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි. මෙම විභාගය II ශ්‍රේණියට උසස්වී වසර තුනක් ඇතුළත සමත් විය යුතුය.

*සටහන* - මෙම *ගැසට් නිවේදනයට* සමගාමීව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ද, අනෙකුත් අදාළ ආයතනවල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මගින්ද නිකුත් කරනු ඇත. ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත් වෙන්කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පතේ ශීර්ෂයේ අදාළ සේවාව හෝ ආයතනය දැක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ. එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.
(නිවැරදි අංකය සටහන් නොකිරීම නිසා ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවන ගැටලු සම්බන්ධව වගකියනු නොලැබේ.)

6.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2019 අගෝස්තු මස 26 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ,

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

7.0 *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* .- අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8.0 (I) *අයදුම්පත්‍ර* .- ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 6.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටු වලට ද ඇතුළත් වන පරිදි "ඒ4" ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත් පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලුම තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කර ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන්න. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(II) පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 500/- ක් ද, එක් විෂයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250/- ක් ද, විභාග ගාස්තු වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයක් වෙත ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදුනොකරන බවද කාරුණිකව දන්වමි. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

9.0 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපතද විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපතද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කර විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

***සටහන*** .- අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

10.0 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

11.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

12.0 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

13.0 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වෙනු ඇත. අදළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතු වේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් වූ විට නිලධාරීන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ. විභාගය සඳහා ඉල්ලුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

14.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබා ගත යුතුවේ. (වැඩි විස්තර සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 05 බලන්න.)

15.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කළ යුතු අතර ඒවා එම භාෂාවෙන්ම පිරවිය යුතුය.

16.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් වූ අයදුම්කරුවන්ගේ නම් රාජ්‍ය පරිපාලන ආපද කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

17.0 *විභාග පරිපාටිය*.- අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | 100 යි | පැය 02 යි | 01 |
| 2. | රජයේ කාර්යාලවල භාවිතා වන ගිණුම් ක්‍රම | 100 යි | පැය 02 යි | 02 |
| | *එකතුව* | *200 යි* | | |

17.1 කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය :

රජයේ කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව යොදගැනීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30 යි. ලකුණු 25 යි.

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය මිනිත්තු 90 යි. ලකුණු 75 යි.

17.2 රජයේ කාර්යාලවල භාවිතවන ගිණුම් ක්‍රම :

රජයේ කාර්යාලවල භාවිත වන ගිණුම් ක්‍රම, ගිණුම් පාලන පොත්පත් හා ඒ සම්බන්ධව නිකුත්කර ඇති භාණ්ඩාගාර මූල්‍ය උපදෙස් හා නියෝග පිළිබඳ දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30 යි. ලකුණු 25 යි.

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය මිනිත්තු 90 යි. ලකුණු 75 යි.

18.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

19.0 "සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ."

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2019 ජූලි මස 12 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(II)2019**

Efficiency Bar Examination for Officers' in Grade II of Public Management Assistant's Service - 2013(II)2019

(මෙම විභාග නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් පමණි.)

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනයේ 5.0 ඡේදයේ සටහන බලන්න) ☐

ගැසට් නිවේදනයේ 3.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයඃ
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——.
(උද : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
:————.
(උද : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 දුරකථන අංකය : ජංගම රාජකාරි

6.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයයන් :-

| *විෂය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |

7.0 දැනට දරන තනතුර :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.
7.3 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියට පත් වූ දිනය :————.

8.0 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 තැපැල්/උපතැපැල් හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය :————.
8.4 ලදුපත් අංකය :————.
8.5 දිනය :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

9.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, මා විභාගයට පෙනී සිටින්නේ ............... වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/රුපියල් ............... ක විභාග ගාස්තුව ............................ තැපැල්/උපතැපැල් කාර්යාලය හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට ......... දින ගෙවා ලබාගත් ලදුපත ඉහත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*සටහන.—* තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................................................... මහතා/ මහත්මිය/මෙනවිය .................................................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, ඔහු/ ඇය විභාග යට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

I ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
II මෙම නිලධාරියා/ නිලධාරිණිය* ඒකාබද්ධ සේවයට අයත් බවත්
III නිලධාරියා/ නිලධාරිණිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/ නොසිටි* බවත්,
IV නිලධාරියා/නිලධාරිණිය* මෙයට පෙර විභාගයට පෙනී සිටි ඇති නිසා නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
V නිලධාරියා/ නිලධාරිණිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අනවශ්‍ය වචන කපා හරින්න.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

07-954

---

**රාජ්‍ය පරිපාලන, ආපද කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (I) 2019

1.0 2013.12.11 දිනැති හා අංක 1840/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8 ඡේදය, 15 ඡේදය (අන්තර්කාලීන විධිවිධාන) සහ ඇමුණුම 06 හි විධිවිධානයන්ට අනුකූලව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 (i) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර I ශ්‍රේණියට උසස් වීමෙන් පසු වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක 05ක් උපයාගෙන ඇති නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ii) මෙම සේවා ව්‍යස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර I ශ්‍රේණියට උසස් වී තිබුණද I ශ්‍රේණියට පත්වීමෙන් පසු වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක 05ක් උපයාගෙන නොමැති නිලධාරීන් සඳහා මෙහි සේවා ව්‍යවස්ථාව යටතේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් වන දින සිට වසර 05ක සහන කාලයක් දෙනු ලැබේ.

3.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහතින් දක්වේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතුන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අයදුම්කරුවන්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු යොදනු ඇත. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතුවේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුරය | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුර | 13 |
| කිලිනොච්චිය | 14 |

4.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

5.0 *සුදුසුකම් .-* රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

සටහන - මෙම විභාගය I ශ්‍රේණියට උසස් වී වසර 05ක් තුළ සමත්විය යුතුය.

මෙම *ගැසට් නිවේදනයට* සමගාමීව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ද, අනෙකුත් අදළ ආයතනවල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මගින්ද නිකුත් කරනු ඇත. ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර වෙන්කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදළ සේවාව හෝ ආයතනය දක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ. එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

**(නිවැරදි අංකය සටහන් නොකිරීම නිසා ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවන ගැටලු සම්බන්ධව වගකියනු නොලැබේ.)**

6.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2019 අගෝස්තු මස 26** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ,
විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය.** අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

7.0 (I) *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව .-* අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(II) *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

8.0 (I) *අයදුම්පත්‍ර .-* ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 6.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි "ඒ4" ප්‍රමාණයේ කඩදසිවල අයදුම්පත්‍ර පිළියෙළ කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(II) පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500/- ක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250/- ක් ද, විභාග ගාස්තු වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

9.0 (I) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කර ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලද අයදුම්කරුවෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීමට අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානම්ව තබා ගැනීමටද ප්‍රයෝජනවත් වනු ඇත.

සටහන : අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(II) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් සහතික කර තිබිය යුතුය.

(III) විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වෙනු ඇත. අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර තුනකට පිළිතුරු සැපයිය යුතුවේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු අය සම්බන්ධ වූ නිලධාරීන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර තුනකට පිළිතුරු සැපයිය යුතුවේ. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

12.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින් ලබා ගත යුතුවේ. (වැඩි විස්තර සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 06 බලන්න.)

13.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් වූ අයදුම්කරුවන්ගේ නම් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළකිරීමට කටයුතු කරනු ඇත.

14.0 *විභාග පටිපාටිය.-* අයදුම්කරුවන් පහත දක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂයය අංකය* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 | ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | 100යි | පැය 01 1/2යි | 01 | 40 |
| 2 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100යි | පැය 01 1/2 යි | 02 | 40 |
| 3 | කාලීන ප්‍රවණතා | 100යි | පැය 01 යි | 03 | 40 |

14.1 ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති :

කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, ඒවායෙහි වැදගත්කම, ලිඛිත සන්නිවේදනය, ලිපිගොනුකරණය හා ආකෘති සම්පාදනය යනාදී විෂයය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි රජයේ කාර්යාලවල ක්‍රියාත්මක වන කාර්යාල ක්‍රම පිළිබඳව දැනුම හා කාර්යාල කටයුතුවල දී ලබාගත් අත්දැකීම්වල ප්‍රවීණතාව පරීක්ෂා කෙරෙන කොටසකින් ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි I වන කාණ්ඩය හා ආයතන සංග්‍රහයේ I වන හා II වන කාණ්ඩවල අන්තර්ගත කරුණු පිළිබඳ දැනුම පරීක්ෂා කරන කොටසකින්ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30 යි. (ලකුණු 25 යි.)

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය මිනිත්තු 60 යි. (ලකුණු 75 යි.)

14.2 රාජ්‍ය මුල්‍ය කළමනාකරණය :

රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ කාර්යාලවල භාවිතා වන මුදල් පාලනය, මුදල් භාරකාරත්වය, ආදායම් හා ගෙවීම්, අයවැය ඇස්තමේන්තු සහ සැපයුම් වැඩ හා සේවා යන විෂයයන් (භාණ්ඩ සමීක්ෂණය හා ගබඩාකරණය, මුදල් රෙගුලාසි, විගණනය පිළිබඳ මූලික දැනුම, මූලික බැංකු පරිචය) පිළිබඳ දැනුම හා අවබෝධය විභාග කිරීම මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂා කෙරේ.

I වැනි කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30 යි. (ලකුණු 25 යි.)

II වැනි කොටස - අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතුය. කාලය මිනිත්තු 60 යි. (ලකුණු 75 යි.)

14.3 කාලීන ප්‍රවණතා

දේශීය හා විදේශීය සිදුවීම් පිළිබඳ කාලීන දැනුම පරීක්ෂා කරන කොටසකින්, කාර්යාල කළමනාකරණය සම්බන්ධ නව ප්‍රවණතා, රාජ්‍ය සේවයේ සේවා සැපයීම පිළිබඳ නව ප්‍රවණතා හා යහපාලනය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන කොටසකින්ද මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ සහ අර්ධ ව්‍යුහගත රචනා මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය)

15.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 "සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ."

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2019 ජූලි මස 12 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ආදර්ශ අයදුම්පත්‍රය

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015(I)2019**

Efficiency Bar Examination for Officers in Grade I of Public Management Assistants' Service - 2015(I)2019

(මෙම විභාග නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් පමණි.)

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනයේ 5.0 ඡේදයේ සටහන බලන්න)

*ගැසට්* නිවේදනයේ 3.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : :————.
(උදා. : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 ජංගම දුරකථන අංකය :

6.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයයන් :-

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |
| | |

7.0 දැනට දරන තනතුර :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.
7.3 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දිනය :————.

8.0 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 තැපැල්/උපතැපැල් හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය :————.
8.4 ලදුපත් අංකය :————.
8.5 දිනය :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

9.0 අයදුම්කරුගේ සහතිකය
ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, මා විභාගයට පෙනී සිටින්නේ .............. වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/රුපියල් ............... ක විභාග ගාස්තුව ........................... තැපැල්/උපතැපැල් හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට .............. දින ගෙවා ලබාගත් ලදුපත ඉහත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

*සටහන.—* තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................................................ මහතා/ මහත්මිය/මෙනවිය ........................................................ වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, ඔහු/ ඇය විභාග යට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

I ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
II මෙම නිලධාරියා/ නිලධාරිණිය* ඒකාබද්ධ සේවයට අයත් බවත්,
III නිලධාරියා/ නිලධාරිණිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/ නොසිටි* බවත්,
IV නිලධාරියා/නිලධාරිණිය* මෙයට පෙර විභාගයට පෙනී සිටි ඇති නිසා නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
V නිලධාරියා/ නිලධාරිණිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්.

මම සහතික කරමි.

* අනවශ්‍ය වචන කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලියාපදිංචි අංකය : පීවී 00213051
ලියාපදිංචි ලිපිනය : අංක 188/2, වලව්වත්ත, ඉහළ කොටුවැල්ල, පන්නල.

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

කෙන්ස් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

07-849

**ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම**

රාගම, වැලිසර, තොටුපල පාර, අංක 76/14 දරන ස්ථානයේ පදිංචි ජා. හැ. ප. අංක 891390157 V දරන වලිමුණි ලක්ෂාන් මිලින්ද මැන්දිස් වන මම, 2014.11.05 වැනි දින එම්. සී. ජී. ආරියසේන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 4234 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර අහෝසි කරන බවත්, මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය කිසිදු නීත්‍යානුකූල වගකීමක් නොදරන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සාමාන්‍ය ජනතාවටත් දැනුම්දෙමි.

වලිමුණි ලක්ෂාන් මිලින්ද මැන්දිස්.

07-851

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : ජෙසිලෝ හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00212805
ලියාපදිංචි ලිපිනය : 68 රණශූර මාවත, වෙන්නවත්ත, වැල්ලම්පිටිය 10600
සංස්ථාගත කළ දිනය : 2019.06.21

ආර්. කේ. ජයවීර,
සමාගම් ලේකම්.

07-858

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ මොළගොඩ, පල්පාත හි පදිංචිව උංගුලෑ ගෙදර මනෝජ් චින්තක අගලවත්ත (ජා. හැ. අ. 723641492 V) වන මා විසින් නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රසාද් විමලරත්න මහතා විසින් ලියා සහතික කළ අංක 159 හා 2009.09.11 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මොළගොඩ, පල්පාත හි පදිංචි උංගුලෑ ගෙදර ෂර්ලි චමින්ද අගලවත්ත (ජා. හැ. අ. 750581684 V) යන අයට පවරන ලදී.

එකී ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2019 ක් වූ ජූලි මස 09 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨකොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

තව ද, එකී ඇටෝර්නි බලකරු වන උංගුලෑ ගෙදර ෂර්ලි චමින්ද අගලවත්ත යන අය විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් සිදු කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබේ.

(උංගුලෑ ගෙදර මනෝජ් චින්තක අගලවත්ත,
ඇටෝර්නි අධිපති)

07-859

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2019 ජූලි මස 02 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : හයිග්‍රේව් කන්සල්ටිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00213182
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 108/3 1/1, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

07-873

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම මහජනතාව වෙත දන්වා සිටිනු ලබන වග නම් :

මීගමුව, කුඩාපාඩුව, කනත්ත පාර, අංක 67 හි පදිංචිව සිට දැනට අංක 53, රොසියන් ක්‍රෙසන්ට්, හරෝව්, මිඩෙක්ස් එච්. ඒ. 1, 25 ඒ, මහ බ්‍රිතාන්‍ය හි පදිංචි වර්ණකුලසූරිය කිංස්ටන් රූස්වෙල්ට් ප්‍රනාන්දු (ජාතික හැඳුනුම්පත් අංකය 730301472 V) වන මා විසින් කෑගල්ල, මොලගොඩ, ගොරොක්ගහකැලේ, අංක : ඩී/54 හි පදිංචි ගමරාලලගේ සුනන්දා මැණිකේ (ජාතික හැඳුනුම්පත් අංකය 646940346 V) වෙත පවරා ඇති වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 29 වැනි දින ආර්. එම්. ඩී. ඒ. එස්. රාජපක්ෂ නීතිඥ මහතා විසින් මහා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර දී සහතික කළ විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත්, මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය මත එකී මාගේ ඇටෝර්නි බලකාරිය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවත්, මෙයින් දැනුම් දෙමි.

07-897

---

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ගණේමුල්ල, බොල්ලත, අංක 162/B/2 දරන ස්ථානයෙහි පදිංචි ඉන්ෂියා කැත්ලින් හැන්සේ වන මා විසින් රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තානාපති වෙනුවට ශ්‍රී ලංකා ඇමතිණී නීතිඥ රාණී බුලත්වෙල මහත්මිය විසින් සහතික කරන ලදුව ඉන්ද්‍රා කුසුම් පැට්‍රිෂියා වෙත ප්‍රදානය කරන ලද, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 37 කාණ්ඩයේ 61 වන පත් ඉරුවේ අංක 18934 දින පොත් අංක යටතේ ලියාපදිංචි කර ඇති 2013.09.24 දිනැති විදේශ සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු මහ ජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

ඉන්ෂියා කැත්ලින් හැන්සේ.

2019 ජුනි මස 21 වැනි දින.

07-917

---

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ජා-ඇල, කනුවන, කුරුඳුවත්ත, ගැමුණු මාවත, අංක 10 C දරන ස්ථානයෙහි පදිංචි වජ්ජක්කාර කංකානම්ලාගේ එඩ්මන්ඩ් අජිත් ප්‍රසන්න ඩයස් සහ ගලුකුලසූරියගේ ජසින්තා රෝස් ශ්‍රියානි පෙරේරා ජයවර්ධන වන අප විසින් ධර්ශිකා නයනා හේරත් ගුණරත්න ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2015.05.08 වැනි දින ලියා සහතික කරන ලදුව කංකානම්ලාගේ ෂර්මන් ජානක ඩයස් වෙත ප්‍රදානය කරන ලද, බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, අංක 139 කාණ්ඩයේ 97 වන පත්ඉරුවේ අංක 4500 දින පොත් අංක යටතේ 2015.05.11 දින ලියාපදිංචි කර ඇති අංක 1029 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමු.

වජ්ජක්කාර කංකානම්ලාගේ එඩ්මන්ඩ් අජිත් ප්‍රසන්න ඩයස්.
ගලුකුලසූරියගේ ජසින්තා රෝස් ශ්‍රියානි පෙරේරා ජයවර්ධන.

2019 ජුනි මස 25 වැනි දින.

07-918

---

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ජා-ඇල, කනුවන, පීටර් රුද්‍රිගෝ මාවත, අංක 48/11 දරන ස්ථානයෙහි පදිංචි වජ්ජක්කාර කංකානම්ලාගේ එඩ්මන්ඩ් අජිත් ප්‍රසන්න ඩයස් සහ ගලුකුලසූරියගේ ජසින්තා රෝස් ශ්‍රියානි පෙරේරා ජයවර්ධන වන අප විසින් ෆිලීෂියන් ප්‍රනාන්දුපුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2011.07.26 වැනි දින ලියා සහතික කරන ලදුව වජ්ජක්කාර කංකානම්ලාගේ ෂර්මන් ජානක ඩයස් වෙත ප්‍රදානය කරන ලද, බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, අංක 56, කාණ්ඩයේ 57 වන පත්ඉරුවේ අංක 7408 දින පොත් අංක යටතේ 2011.08.10 දින ලියාපදිංචි කර ඇති අංක 16235 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමු.

වජ්ජක්කාර කංකානම්ලාගේ එඩ්මන්ඩ් අජිත් ප්‍රසන්න ඩයස්.
ගලුකුලසූරියගේ ජසින්තා රෝස් ශ්‍රියානි පෙරේරා ජයවර්ධන.

2019 ජුනි මස 25 වැනි දින.

07-919

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥපනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : ඉමර්සී ෆිෂිං අඩ්වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 00212473
ලියාපදිංචි ලිපිනය : අංක 22/1, මාර්ෂල්ස් පාර, කොච්චිකඩේ
සංස්ථාගත කළ දිනය : 2019.06.09

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-922

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ජා-ඇල ශාන්ත මරියා පාර අංක 74/2 හි පදිංචි වත්තලපේඩිගේ ජෝෂප් වසන්ත කුමාර ප්‍රනාන්දු හෙවත් වත්තලගේ ජෝෂප් වසන්ත කුමාර ප්‍රනාන්දු (ජා. හැ. ප අංක 560292155 V) වන මම ජා-ඇල ශාන්ත මරියා පාර අංක 74/2 හි පදිංචි වත්තලගේ මලිෂා අනුරුද්දි ප්‍රනාන්දු (ජා. හැ. ප. අංක 876711028 V) අයව ඉතාලිය රෝමය හි ශ්‍රී ලංකා තානාපති වෙනුවට රාණි බුලත්වෙල විසින් වර්ෂ 2014.10.13 දින සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2019.07.12 වැනි දින පටන් මෙයින් අවලංගු කර බල රහිත කරමි.

මෙම දිනයෙන් පසු එම වත්තලගේ මලිෂා අනුරුද්දි ප්‍රනාන්දු යන අය මෙම ඇටෝර්නි බලපත්‍රයට අදාළව කරන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බව ලංකා රජයට හා මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

ඩබ්. ජේ. ඩබ්. කුමාර ප්‍රනාන්දු.

07-957

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වමු.

සමාගමේ නම : විස්මාස් ඉක්න්ජෙට් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
ලියාපදිංචි අංකය : පී වී 123446
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 36, යක්කල පාර්ක් ෂොපිං කම්ප්ලෙක්ස්, නුවර පාර, යක්කල
ලියාපදිංචි කළ දිනය : 2017.06.28

සමාගම් ලේකම්.

07-985

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වමු.

සමාගමේ නම : සූරි ඒජන්සි (පී. වී. ටී.) එල්. ටී. ඩී.
ලියාපදිංචි අංකය : පී වී 99494
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 61 - B ශ්‍රී මහා විහාර පාර, කළුබෝවිල, දෙහිවල.
ලියාපදිංචි කළ දිනය : 2014.07.04

සමාගම් ලේකම්.

07-986

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

තැ. පෙ. 22550, දෝහා කටාර් හි එයාවේස් (Q. C. S. C.) ප්‍රධාන විධායක නිලධාරි, අක්බර් අල් බකර් වන මා විසින් කටාර් එයාවේස් 3 අදියර, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 01 හි අජේ ජේකබ් (ඉන්දියානු ගුවන් බලපත්‍ර අංක H 8422051) වෙත බලය පවරන ලද 2013.04.01 දින දරන දෝහා කටාර් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වෙනුවෙන් සිටින නිලධාරියා විසින් 2013.04.02 වැනි දින සහතික කරන ලද, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශයේ ලේකම්වරයා විසින් 2013.04.10 වැනි දින අනුමත කරන ලද 2013.05.22 දින, බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලය, මගින් පවත්වාගෙන යනු ලබන ලිඛිත බලධාරිකම් පොතෙහි, දිනපොත් අංක 4552 හි 96 වන පත්ඉරුවෙහි 110 වන වෙළුමෙහි ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2019 අප්‍රේල් මස 08 වැනි දින සිට අවලංගු කරන බවටත්, ඉහත කී අජේ ජේකබ් විසින් අපගේ ඇටෝර්නි බලකරු ලෙස සිදු කරන කිසිදු ක්‍රියාවකට අප විසින් වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

07-988

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 86/1, පුංගන්කුලම් පාර, අරියාලේ යාපනයේ සිටි, එනමුත් දැනට 25 Buttfield Close, Dagenham හි පදිංචි ගිරිදරන් යෝගේස්වරි වන මා විසින් අංක 132 කච්චේරි නල්ලූර් පාර, යාපනය ශ්‍රී ලංකාවෙහි පදිංචි සෙල්ලයියා යෝගේස්වරන් යන අය වෙත ප්‍රදානය කරන ලද මා විසින් අත්සන තබන ලද හා සබීකා ජවාඩ් සහ එම්. ඒ. සූරියමූර්ති යන අයවලුන් සාක්ෂිකරුවන් වූ 2015.07.24 දිනැති ඇටර්නි බලපත්‍රය 2018.09.26 දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කොට අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි ජනරජයටත් එහි පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි.

ගිරිදරන් යෝගේස්වරි.

07-994

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බෙලිහුල්ඔය මුත්තෙට්ටුවේගම සර්වෝදය කඩේ ලිපිනයෙහි පදිංචි සුමනසිරිගේ මර්වින් සුරේන්ද්‍ර කීර්ති ගුණරත්න (ජා. හැ. අංක 621970240 V) වන මා විසින් ශ්‍රී ලංකා දකුණු කොරියානු තානාපතිතුමාගේ අත්සන නොව එම කාර්යාලයේ බලයලත් නිළධාරි මහත්මයකු විසින් සහතික කරන ලද අංක ආර් ඕ කේ/ඒ ටී ටී/12/126 හා 2012.02.21 දින දරන හා රෙජිස්ට්‍රාර් ජනරාල් සබරගමුව කලාප කාර්යාලයේ අංක 294 යටතේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත ලිපිනයෙහි පදිංචි බෝධිමළුවේ මුදියන්සේගේ නොහොත් කොස්ඉන්න මොහාට්ටාලලාගේ කල්‍යානවතී (ජා. හැ. අංක 608090320 V) මහත්මියට පවරන ලද ඇටෝර්නි බලය 2019.06.17 දින සිට අවලංගු කරන්නට යෙදුනු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා පොදු මහජනතාවට මින් දන්වමි.

සුමනසිරිගේ මර්වින් සුරේන්ද්‍ර කීර්ති ගුණරත්න.

07-996

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

පහත අත්සන් කරන දැනට අංක 78/C, ද මැල්වත්ත පාර, කොස්වත්ත, නාවල, රාජගිරිය දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 650891384 V හිමි රංජන ගාමණී වල්පොල වන මා විසින් මොරටුව, ශාන්ත පීතර පාර, අංක 33 ලුම්බිණි දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 580380530 V හිමි දියගොහැන්නදි ජයවීර පටබැඳිගේ අනුර සුධර්මන් ද සිල්වා යන අය වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් රංමුතුගේ දර්ශන ප්‍රියශාන්ත මහතා විසින් 2019.06.14 දින සහතික කරන ලද අංක 045 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී දියගො හැන්නදි ජයවීර පටබැඳිගේ අනුර සුධර්මන් ද සිල්වා යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් තවදුරටත් ක්‍රියා නොකරන බවත්, මෙතැන් පටන් ඔහු විසින් එළඹෙන කවර හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ආණ්ඩුවටත් මහ ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

රංජන ගාමණී වල්පොල.

2019 ජූලි මස 12 වැනි දින.

07-997

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෑගල්ල, රන්වල, ගල්කැටියේ හේන යන ලිපිනයේ පදිංචි නෙලුන්දෙනියලාගේ අජන්තා මාලනී වන මා විසින් කෑගල්ල, අඹන්පිටිය, රන්වල වත්ත යන ලිපිනයේ පදිංචි නෙලුන්දෙනියලාගේ ජගත් නිශාන්ත යන අය මා නමින් සහ මා වෙනුවෙන් කටයුතු කිරීම පිණිස මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරමින්, නීතිඥ හා කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. ඩබ්ලිව්. ධම්මික කේ. අමරසිංහ මහතා ලියා සහතික කළ අංක 329 සහ 2006.07.13 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර අහෝසි කර බල ශූන්‍ය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මින් මතු එකී බලපත්‍රය ප්‍රකාරව මා නමින් පෙනී සිටින නෙලුන්දෙනියලාගේ ජගත් නිශාන්ත යන අය විසින් සිදු කරනු ලබන සෑම ක්‍රියාවක් ම බල රහිත හා බල ශූන්‍ය බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

නෙලුන්දෙනියලාගේ අජන්තා මාලනී.

07-998

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම සංස්ථාපනය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : රෝයල්වේ ඉන්වෙස්ට්මන්ට් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00208179
ලියාපදිංචි දිනය : 2019.01.28
ලියාපදිංචි කාර්යාලය : අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.

සමාගම් ලේකම්.

07-1002

---

## රටබීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

### නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2020 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව 2020 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් 2019.09.18 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝර්මයක් මගින් ඉදිරිපත් කළ යුතු ය;

(ආ) ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය;

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතුය.

(ඈ) ටෙන්ඩර් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය :-

(1) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේදී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය;

(2) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව, ජාතික හැඳුනුම්පත් අංකයද යෙදිය යුතුය;

(3) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය;

(4) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පෝර්ම සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය හා නම් සඳහන් කර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප.ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. මෙම මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් නමින් නුවරඑළිය ලංකා බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කීප දෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුයි.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2019.10.31 වැනි දින පෙ.ව. 10.30 ට මෙම ස්ථානයේ දී නැවත විකුණනු ලැබේ.

10. මෙම රේන්ද විකිණීම සම්බන්ධයෙන් මගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීමට අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ හැකිය.

ඩබ්. එම්. ආනන්ද,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2019 ජූලි මස 09 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නුවරඑළිය.

උපලේඛනය

විදේශ මත්පැන් තැබෑරුම්

| අංකය හා තැබෑරුමේ නම | තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය | ටෙන්ඩර් භාර ගන්නා දිනය | ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|
| අංක 01- නුවරඑළිය | නුවරඑළිය මහ නගර සභා අංක 06 කොට්ඨාසය තුළ | 2019.09.18 | පෙ.ව. 10.30 | රු. 5,000 |

07-877

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

2018.02.16 වැනි දින නිවේදන අංක 02-589 යටතේ පළ වූ වෙන්දේසි දැන්වීම නැවත පළකිරීමයි

## හැටන් නැෂනල් බැංකුව පීඑල්සී කල්මුණේ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ සහ කරේයිවකු පත්තුවේ කල්මුණේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කල්මුණේ මහ නගර සභා සීමාව තුළ මනෙයිකුදිරිප්පු පලෙයි පාරේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එළවරසු විසින් මැන සාදන ලද බෙදු වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ප්‍රමාණයෙන් අක්. 0 රූඩ් 0 පර්චස් 7.34

ඉඩමට ප්‍රවේශ මාර්ගය .- බැංකුවේ සිට අක්කරෙයිපත්තු වීදියේ තාරව කෝවිල තෙක් පැමිණ වමට හැරී තාරව කෝවිල පාරට පිවිසෙන්න. එම පාර දිගේ විදුලිබල මණ්ඩලයේ හත්වෙනි අධිබල විදුලි කුළුණ තෙක් පැමිණි පසු අදාළ දේපළ පාරේ දකුණු පැත්තේ පිහිටා ඇත.

මොහොමඩ් අලියාර් රවීයා සහ මොහොමඩ් ඊබ්‍රාහම් කලීමුදීන් යන අයට ලබාදුන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් බැඳුම්කරුවන් වශයෙන් හැටන් නැෂනල් බැංකුව පී එල් සී වෙත උකස් කරන ලද දේපළ 2019 අගෝස්තු මස 22 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 11.00ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014 ඔක්තෝබර් මස 24 වැනිදා රජයේ ගැසට් පත්‍රය සහ ඩේලිමිරර් ලක්බිම සහ තිනකරන් පුවත්පත් බලන්න.

ගෙවීම් කරන පිළිවෙල. - සාර්ථක ගැනුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුයි.

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එක) දේශීය විකුණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජයේ හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාළ වේ නම් ඒවා ද සමග වෙන්දේසි දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ ලිපි ලේඛන කොළඹ ටී බී ජයා මාවත අංක 479 හැටන් නැෂනල් බැංකුව පී එල් සී සමාන්‍යාධිකාරි (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂා කර බැලිය හැකි ය.

දුරකථන අංක : 011- 2661816, ෆැක්ස් අංකය : 011 - 2661835.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා ගාඩ්න්ස් දුටුගැමුණු වීදියෙන් හැරී කොහුවල.
දුරකථන අංක : 011 4302622, 011-4302623,

07-846

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ටී. ඒ. අයි. ගුණපාල සහ කේ. එස්. ප්‍රියදර්ශනී.
ගිණුම් අංක : 0166 5000 3121.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.04.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හය කෝටි විසි එක් ලක්ෂ දහ හතර දහස් තුන්සිය දහයයි ශත විස්සක (රු. 62,114,310.20) මුදල ද, 2019 මාර්තු මස 27 වැනි දින සිට අංක 2442, 3243, 4773, 4949, 4775 සහ 4777 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දොළොස් ලක්ෂයක (රු. 1,200,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) බැගින් වූ පොළිය ද, හා රුපියල් පන් කෝටි හැට අට ලක්ෂ පනස් හතර දහසක (රු. 56,854,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ වැඩිදුර පොළියක් ද, රුපියල් අට ලක්ෂයක (රු. 800,000) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate of Three per centum (3%) per annum (Floor rate of 12% ) , බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.06.21 දින රජයේ ගැසට් පත්‍රයේ 2019.06.21 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.08.22 දින අංක 405/2014 දරන පිඹුරේ ලොට් අංක 7A පෙ. ව. 11.00 ට අංක 11915 දරන පිඹුරේ ලොට් අංක 01 පෙ. ව. 11.30 ට අංක 5568 දරන පිඹුරේ ලොට් අංක 01 පෙ. ව. 11.45 ට සහ අංක 5569 දරන පිඹුරේ ලොට් අංක 01 ප. ව. 12.15 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මැද පත්තු බටහිර කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පොල පන්නල ප්‍රාදේශීය සභා සීමාවන් සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය සහ මොහොත්තාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පහල මොහොත්තාව ග්‍රාමයේ පිහිටි "නුගගහමුලහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. කේ. පී. ඔකඳපොළ යන අය විසින් සාදන ලද 2014 ඔක්තෝබර් මස 18 දාතම හා අංක 405/2014 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 7A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන ආර්. රත්නායක යන අය විසින් සාදන ලද 2002 අගෝස්තු මස 10 දාතම හා අංක 1028 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 1 සහ පාර (ප්‍රාදේශීය සභා), නැගෙනහිරට : එකී අංක 1028 දරන පිඹුරේ ලොට් 8, දකුණට : අංක 1028 දරන පිඹුරේ ලොට් 8 සහ 10 සහ බස්නාහිරට: FVP 345 එරපොල ග්‍රාම සීමාව සහ FVP 343 හි ලොට් 2G යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් එකොළහයි දශම අටක් (A:3, R:0, P:11.8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 405/2014 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව E 109/57 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1028 දරන පිඹුරේ ලොට් 3 සහ 8 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 2442 සහ 3243 මගින් හා ඒවා යටතේ උකස්කොට ඇපකොට ඇත.)

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මැද පත්තු බටහිර කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පොල පන්නල ප්‍රාදේශීය සභා සීමාවන් සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය සහ මොහොත්තාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පහල මොහොත්තාව ග්‍රාමයේ පිහිටි "කැටකැලගහමුලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. ආර්. යාපා යන අය විසින් සාදන ලද 2010 මැයි මස 23 දාතම හා අංක 11915 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැලණියමුල්ල සිට හමන්ගල්ල දක්වා පාර (මහා මාර්ගය), නැගෙනහිරට : පාර, දකුණට : ඉන්ගරදවුල රජයේ පාසැල් ඉඩම සහ පරිශ්‍රයන් සහ බස්නාහිරට : ඉන්ගරදවුල රජයේ පාසැල් ඉඩම සහ පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස්පහයි දශම අටක් (A:0, R:1, P:35.8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 11915 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව E 219/88 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 11915 දරන පිඹුරේ නිරූපිත එකී දේපළේ නැගෙනහිර මායිම වශයෙන් නිරූපිත පාර දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 4773 සහ 4949 මගින් හා ඒවා යටතේ උකස්කොට ඇපකොට ඇත.)

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මැද පත්තු බටහිර කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පොල පන්නල ප්‍රාදේශීය සභා සීමාවන් සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය සහ මොහොත්තාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මොහොත්තාව ග්‍රාමයේ පිහිටි "කොහොඹගහමුල වත්ත සහ කොහොඹගහමුල හේන දැන් වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ඒ. එම්. සී. බණ්ඩාර යන අය විසින් සාදන ලද 2014 මැයි මස 03 දාතම හා අංක 5568 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (මහා මාර්ගය), නැගෙනහිරට : වර්තමානයේ චාර්ලිස් අප්පුහාමි විසින් හිමිකම් කියනු ලබන ඉඩම බලයලත් මානක තැන එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් සාදන ලද 1999 මැයි මස 02 දාතම හා අංක 2367 දරන පිඹුරේ ලොට් 6, දකුණට : වර්තමානයේ පොදු පාර, අංක 2367 දරන පිඹුරේ ලොට් 14 සහ බස්නාහිරට : එකී අංක 2367 දරන පිඹුරේ ලොට් 4 සහ වර්තමානයේ ජේ. එම්. ආර්. එස්. ජයසුන්දර විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකොළහයි දශම හතක් (A:0, R:1, P:11.7) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5568 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව E 184/126 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 4775 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

4. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මැද පත්තු බටහිර කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පොල පන්නල ප්‍රාදේශීය සභා සීමාවන් සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මොහොත්තාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මොහොත්තාව ග්‍රාමයේ පිහිටි "කොහොඹගහමුල වත්ත සහ කොහොඹගහමුල හේන දැන් වත්ත" යයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන එච්. ඒ. එම්. සී. බණ්ඩාර යන අය විසින් සාදන ලද 1999 මාර්තු 26 දාතම හා අංක 2367 දරන පිඹුරේ ලොට් 11හි නැවත මිනුමක් වන) බලයලත් මානක එච්. ඒ. එම්. සී. බණ්ඩාර යන අය විසින් සාදන ලද 2014 මැයි 03 දාතම හා අංක 5569 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වර්තමානයේ පොදු පාර අංක 2367 දරන පිඹුරේ ලොට් 14, නැගෙනහිරට : වර්තමානයේ චාර්ලිස් අප්පුහාමි විසින් හිමිකම් කියනු ලබන ඉඩම අංක 2367 දරන පිඹුරේ ලොට් 10, දකුණට : ඇළ සහ බස්නාහිරට : එකී අංක 2367 දරන පිඹුරේ ලොට් 12 සහ වර්තමානයේ ජෝකීනු අප්පුහාමි විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් විස්සක් (A:0, R:2, P:20) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5569 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව E 219/89 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එච්. ඒ. එම්. සී. බණ්ඩාර යන අය විසින් සාදන ලද 1999 මාර්තු 26 දාතම හා අංක 2367 දරන පිඹුරේ නිරූපිත ලොට් 14 දිගේ හා ඒ මතින් හා යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 4777 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-964

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ස්ථිර අයිරා යොමු අංකය - 605705
පානදුර, කෙසෙල්වත්ත, ගාලු පාර, අංක 29 සෝලා ටයර් ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගමට අයත් උකස් කරන ලද දේපල.

1. බේරුවලතොටගේ මේරි පවුලින් ශාන්ති ප්‍රනාන්දු මිය
2. බැමිනිහැන්නදිගේ ශාමිලා ප්‍රසංගි ප්‍රනාන්දු මිය
3. කහවෙවිදානෙලාගේ දොන් රන්ජන් ලාල් විජේගුණවර්ධන අධ්‍යක්ෂවරු වෙති.

ලංකා බැංකු අඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.08.03 දිනැති අංක 2083 දරන ගැසට් පත්‍රයේ හා 2018 ජූලි 26 වන බ්‍රහස්පතින්දා දින ''ඩේලිනිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2019.08.13 වැනි දින ප. ව. 1.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර තොටමුනේ, කෙහෙල්වත්ත සුළු නගර සභා සීමාවේ, හේනමුල්ලේ පිහිටි " ආර්ඩින් ෆොරස්ට්" නැමති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සමග බලයලත් මිනින්දෝරු කේ. කේ. තිරුවානාවුකරුසු විසින් සාදන ලද 1968 ජනවාරි 23 දිනැති අංක 590 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2, උතුරට : අඩි 30 පළල පාරට වෙන් කළ කොටස (අංක 590 දරන පිඹුරෙහි ලොට් 13 ද), නැගෙනහිරට : කොළඹ සිට පානදුර දක්වා ගාලු පාරද, දකුණට : කෙහෙල්වත්ත සුළු නගර සභා පරිශ්‍රය ද (ලොට් 1 PPA 2599) හා බස්නාහිරට : අංක 590 දරන පිඹුරෙහි ලොට් 3 ද මායිම්ව එකී අංක 590 දරන පිඹුරට අනුව පර්චස් විසිතුනයි දශම හයක (අ. 0, රූ. 0, පර්. 23.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F568/106 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු බී. ඩී. ප්‍රනාන්දු විසින් මැතක දී සාදන ලද 1991 ජුනි මස 7 දිනැති අංක 3475 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී හේනමුල්ල පිහිටි "ආර්ඩින් ෆොරස්ට්" නැමති ඉඩම එහි ඇති ගහකොළ, වගාවන් සහ ගොඩනැගිල්ල ඇතුළත් වූ අංක 3475 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2, උතුරට : පාර (අංක 590 දරන පිඹුරෙහි ලොට් 13 ද), නැගෙනහිරට : ගාලු පාර ද, දකුණට : කෙහෙල්වත්ත පොලිස් ස්ථාන පරිශ්‍රය (කලින් කෙහෙල්වත්ත සුළු නගර සභා පරිශ්‍රය ද), බස්නාහිරට : අංක 590 දරන පිඹුරෙහි එම ඉඩමේ ලොට් 3 ද මායිම්ව එකී අංක 3475 දරන පිඹුරට අනුව පර්චස් විසිතුනයි දශම තුනයි හතක (අ. 0, රූ. 0, පර්. 23.37) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

### දෙවන උපලේඛනය

එකී හේනමුල්ල පිහිටි "ආර්ඩින් ෆොරස්ට්" නැමති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන් සහ ගොඩනැගිල්ල ඇතුළත් වූ අංක 590 දරන එකී පිඹුරෙහි ලොට් 13 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 13, උතුරට : අංක 590 දරන පිඹුරෙහි 1, 4, 6, 8, 14, 16 සහ 33-37ද, නැගෙනහිරට : ලොට් 5 සහ 4 කොළඹ සිට ගාල්ල දක්වා පාර, ලොට් 18 සිට 24 සහ ලොට් 38 සිට 45 ද, දකුණට : ලොට් 2, 3, 9 සිට ලොට් 12, 17, 18, 32, 38 සහ A1 ද, බස්නාහිරට : ලොට් 7, 8, 25 සිට 32 සහ B1, B2, B3 සහ B4 ද මායිම්ව එකී අංක 590 දරන පිඹුරට අනුව අක්කර එකයි රූඩ් එකයි පර්චස් හතක (අ. 1, රූ. 1, පර්. 7) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F526/232හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි. පී. කේ. එන්. පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණි.

ලංකා බැංකුව,
පානදුර අධිශ්‍රේණි ශාඛාව.

07-960

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක - 80650878.
ණය යොමු අංක - 80651660.

අලුත්ගම, කලුවාමෝදර, දේවාල පාර, අංක 74, හොටෙල් බ්ලූ සැෆයර් සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

1. වෙඩික්කාර උඩර්ම මන්දු රාජික් ද සිල්වා මහතා
2. දෙමුනි නාලනි සේපාලිකා ද සිල්වා මහත්මිය හවුල්කරුවෝ වෙති.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.03.29 දිනැති අංක 2117 දරන ගැසට් පත්‍රයේ හා 2019 මාර්තු 18 වැනි සඳුදා දින ''දිනමිණ'' ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළකරන ලද නිවේදනවලට අනුකූලව මුල් ණය මුදල් වල ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දීම 2019.08.13 දින ප.ව. 3.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, දකුණු කලුතර තොටමුනේ, අලුත්ගම් බැද්දෙ නැගෙනහිර කලුවාමෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ (මාලේවන්බැද්ද උප කාර්යාලය) කලුවාමෝදර පිහිටි "වතුබොඩේ කුඹුර සහ මහඹිටිට හෙවත්

මහකුඹුර" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඕ. එස්. බී. කුමාරසිරි විසින් සාදන ලද 2016 නොවැම්බර් මස 23 සහ 2016 දෙසැම්බර් මස 15 දිනැති අංක 4969 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් A උතුරට : මහගොඩැල්ල හෙවත් වතුබොඩඹිවිට සහ ලොට් B ද, නැගෙනහිරට : ලොට් B සහ දේවාල පාර ද, දකුණට : වැත්තහේවගේ ලියද්ද හෙවත් කොම්බුවපිටිය සහ බත්හැලිය කඩුවන්ගෙවත්ත වතුබොඩඹිවිට හා අංක 1854 දරන පිඹුරෙහි ලොට් 3B (අඩි 10 පළල පාර) ද, බස්නාහිරට : 1741 දරන පිඹුරෙහි ලොට් 2C සහ එම ඉඩමේ ලොට් 1 සහ කඩවුන්ගෙවත්ත වතුබොඩඹිවිට ද මායිම්ව එකී අංක 4969 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් අටක (අ. 0, රූ. 2, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 158/129 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙහි උප බෙදීමක නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමකි :

1. බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, දකුණු කලුතර තොටමුනේ, අලුත්ගම් බැද්දේ නැගෙනහිර කලුවාමෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ (මාලේවන්බැද්ද උප කාර්යාලය) කලුවාමෝදර පිහිටි "මහඹිවිට හෙවත් ලොට් 3හි මහකුඹුර" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්. පෙරේරා විසින් සාදන ලද 2004 ජුනි මස 18 දිනැති අංක 2618 දරන පිඹුරෙහි ලොට් 3A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 3A උතුරට : මහගොඩැල්ල හෙවත් වතුබොඩඹිවිට සහ දේවාල පාර ද, නැගෙනහිරට : දේවාල පාර සහ ගලබැන්ද ලියද්ද ද, දකුණට : ගලබැන්ද ලියද්ද සහ වතුබොඩඹිවිට ද, බස්නාහිරට : වතුබොඩඹිවිට සහ වටුවගෙ ලියැද්ද හෙවත් රදුන්ගේවත්ත ද මායිම්ව එකී අංක 2618 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් දොළහයි දශම අටයි තුනක (අ. 0, රූ. 1,පර්. 12.83) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 158/49 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු එච්. පී. ද එස්. තාබෲ විසින් මෑතකදී මැන සාදන ලද 2005 ජුනි මස 20 දිනැති අංක 1854 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී කලුවාමෝදර පිහිටි "මහඹිවිට හෙවත් මහකුඹුර" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත් වූ එකී අංක 1854 දරන පිඹුරෙහි ලොට් 3A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3A උතුරට : මහගොඩැල්ල හෙවත් වතුබොඩඹිවිට ද, නැගෙනහිරට : දේවාල පාර සහ ගලබැන්දලියද්ද (දැන් අඩි 10 පළල පාර)ද, දකුණට : වතුබොඩඹිවිට සහ අඩි 10 පළල පාර, ලොට් 3B සහ බස්නාහිරට : වතුබොඩඹිවිට සහ වටුවගෙලියද්ද හෙවත් රදුන්ගෙවත්ත ද මායිම්ව එකී අංක 1854 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් එකොළහයි දශම නවයයි පහක (අ. 0, රූ. 1, පර්. 11.95) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

2. බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, දකුණු කලුතර තොටමුනේ, අලුත්ගම් බැද්දේ, අංක 762C කලුවාමෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ (මාලේවන්බැද්ද උප කාර්යාලය) කලුවාමෝදර පිහිටි "ලොට් 2 වතුබොඩේකුඹුර" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එච්. පී. ද එස්. තාබෲ (එහෙත් බලයලත් මිනින්දෝරු ඒ. නිලූක එස්. ඩී. සල්වා ලෙස ලියාපදිංචි) 2005 ජනවාරි මස 8 දිනැති (එහෙත් වඩාත් නිවැරදිව 2005 මාර්තු මස 8 දිනැති) අංක 1741 දරන පිඹුරෙහි ලොට් 2B1 ලෙස දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2B1 උතුරට : ගාලු පාරේ සිට සීලානන්ද පාර දක්වා දිවෙන පාර ද, නැගෙනහිරට : ලොට් 2B2 (එහෙත් 2B ලෙස ලියාපදිංචි) සහ දෙනියගෙඹිවිට හෙවත් මහකුඹුර සහ ලොට් 2B3 ද, දකුණට : වත්තහේවගේ ලියද්ද හෙවත් කොම්බුවපිටිය සහ බත්හැලිය ද, බස්නාහිරට : අඩි 10 පළල පාර (ලොට් 2C) සහ ලොට් 2A ද මායිම්ව එකී අංක 1741 දරන පිඹුරට අනුව පර්චස් තිස්හතක (අ. 0, රූ. 0, පර්. 37) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 158/47 හි ලියාපදිංචි කර ඇත.

3. එකී කලුවාමෝදර පිහිටි "වතුබොඩේ කුඹුර" නමැති ඉඩමේ එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත් වූ එකී අංක 1741 දරන පිඹුරෙහි ලොට් 2B3 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2B3 උතුරට : ලොට් 2B1 ද, නැගෙනහිරට : දෙනියගෙඹිවිට හෙවත් මහකුඹුර ද, දකුණට : වත්තහේවගේ ලියද්ද හෙවත් කොම්බුවපිටිය සහ බත්හැලිය (ලොට් 2B1 ලෙස ලියාපදිංචි) ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 2B1 ද මායිම් ව එකී අංක 1741 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම තුනයි දෙකක (අ. 0, රූ. 0, පර්. 1.32) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 158/48 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ගරුසිංහ මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
අලුත්ගම.

07-958

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.

ණය යොමු අංක : 82355608, 82355717.

කොස්ගොඩ, එගොඩදූව, පුංචිමලකන්ද, බෝගහවාඩිය වත්ත, තොම්මාදුර ඉරේෂ් පාලිංග හංසරාජ මෙන්ඩිස් මහතාට අයත් උකස්කරන ලද දේපළ විකිණීම

ලංකා බැංකු අඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 මැයි මස 03 දිනැති අංක 2122 දරන ගැසට් පත්‍රයේ හා 2019 අප්‍රේල් මස 18 වැනි දින ඩේලිනිවුස්, තිනකරන් හා දිනමිණ යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර කොස්ගොඩ එකී ස්ථානයේ දී ම 2019.08.20 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එම් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### පළමු උපලේඛනය

1. දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිටි කෝරළේ බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ අංක 15 දරන දුවේමෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොස්ගොඩ දුවේමෝදර පිහිටි ''පුංචමලකන්ද'' නමැති ඉඩමේ ලොට් X ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් X උතුරට T. P. 187249 හි ඉඩම ද නැගෙනහිරට : අංක 2728 දරන පිඹුරෙහි ලොට් 3A2 ද දකුණට ලොට් Y (අංක 2728 දරන පිඹුරේ සලකුණු කිරීම) සහ බස්නාහිරට එකී ලොට් Y සහ පාර ද, මායිම්ව බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2007 නොවැම්බර් මස 27 දිනැති අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ආකාරයට අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දෙකක (අ. 1, රූ. 3, පර්. 2) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස්, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සහිතය. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 58/12 හි ලියාපදිංචි කර ඇත.

2. එකී කොස්ගොඩ දුවේමෝදර පිහිටි ''පුංචමලකන්ද'' නමැති ඉඩමේ ලොට් 3A2 ලෙස දක්වා සීමා විස්තර කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3A2 උතුරට T. P. 187249 හි ඉඩම ද, නැගෙනහිරට T. P. 155449 හි ඉඩම ද, දකුණට එම ඉඩමේ ලොට් 3B ද, බස්නාහිරට එම ඉඩමේ ලොට් 3A1 සහ ලොට් 3A3 (පාරට වෙන් කළ කොටස) ද, මායිම්ව බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2007 නොවැම්බර් මස 27 දිනැති අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ආකාරයට අක්කර එකයි රූඩ් එකයි පර්චස් දාහතයි දශම තුනක (අ. 1, රූ. 1, පර්. 17.3) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස්, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ සමග වේ. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 58/26 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට ලොට් 3 හි ලොට් 3A හි ලොට් 3A3 මතින් හා ඒ දිගට මාර්ග අයිතිය ද ඇත.

එකී දුවේමෝදර පිහිටි ''පුංචමලකන්ද'' නමැති ඉඩමේ ලොට් 3 හි ලොට් 3A හි ලොට් 3A3 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3A3 උතුරට එම ඉඩමේ ලොට් 3A1 ද නැගෙනහිරට එම ඉඩමේ ලොට් 3A2 ද, දකුණට එම ඉඩමේ ලොට් 3B ද, බස්නාහිරට ලොට් 2 (අඩි 16 පළල) මායිම් එකී අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ආකාරයට පර්චස් දහඅටක (අ. 0 රූ. 0 පර්. 18) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 58/13 හි ලියාපදිංචි කර ඇත.

3. එකී කොස්ගොඩ දූවේමෝදර පිහිටි සහ බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2008 ජනවාරි මස 2 දිනැති අංක 2815 දරන පිඹුරෙහි නිරූපිත පුංචමාලකන්ද හි ලොට් J ලෙස දක්වා ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් J උතුරට එම ඉඩමේ ලොට් K ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් K ද, දකුණට ලොට් 3A3 ද, බස්නාහිරට පාර ද මායිම්ව පර්චස් විස්සක (අ. 0 රූ. 0 පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 72/105 හි ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම පහත විස්තර කර ඇත ඉඩමට සර්වසම වේ.

එකී කොස්ගොඩ දූවේමෝදර පිහිටි පුංචමලකන්දෙහි ලොට් Y ලෙස දක්වා බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් සාදන ලද 2007.11.27 දිනැති අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත එකී ලොට් Y උතුරට එකී අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ලොට් X ද නැගෙනහිරට එකි අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ලොට් X ද දකුණට එකී අංක 2728 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 3A3 (පාරට වෙන්කළ කොටස) ද, බස්නාහිරට පාර ද මායිම්ව පර්චස් විස්සක (අ. 0 රූ. 0 පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සමග වේ. මෙය බලපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D/72/105 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එස්. පී. ගුණතිලක,
කළමනාකාරිණී.

2019 ජුනි මස 24 වැනි දින,
ලංකා බැංකුව,
අහුංගල්ල.

07-959

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ආර්. එම්. ඒ. එස්. ආර්. කේ. රත්නායක.
ගිණුම් අංක : 1063 5494 6874.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.02 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි අසූ දෙලක්ෂ එකොළොස් දහස් නමසිය හැට එකයි ශත හතළිහක (රු. 18,211,961.40) මුදල ද, 2019 අප්‍රේල් මස 03 වැනි දින සිට අංක 3741 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි හැට හතර ලක්ෂ විසි අට දහස් පන්සියයක (රු. 16,428,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) තවත් රුපියල් දස ලක්ෂයක (රු. 1,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.06.14 දින රජයේ ගැසට් පත්‍රයේ 2019.06.06 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.08.27 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දි කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කුමාරගේවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තලංගම ග්‍රාමයේ පිහිටි ලේක් පාර, වරිපනම් අංක 43/1 දරන "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. ඩී. කේ. ආර්. පී. පතේගම යන අය විසින් සාදන ලද 2017 සැප්තැම්බර් මස 28 දාතම හා අංක 6600 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩයිනග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ තවත් අය හිමිකම් කියනු ලබන දේපළ සහ අංක 1278 දරන පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : අංක 1278 දරන පිඹුරේ ලොට් 2 සහ පුද්ගලික පාර, දකුණට : පුද්ගලික පාර, අංක 1278 දරන පිඹුරේ ලොට් 9 සහ එෆ්. ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ බස්නාහිරට : එෆ්. ප්‍රනාන්දු සහ ඩයිනග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහක් (A:0, R:0, P:35) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6600 දරන පිඹුරට අනුවය.

**එකී ලොට් 1A පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :**

එකී තලංගම පිහිටි "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. හෙට්ටිගේ යන අය විසින් සාදන ලද 1991 අගෝස්තු මස 20 දාතම හා අංක 1278 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. ජී. පීරිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : මෙහි ලොට් 2 සහ 8, දකුණට : ලොට් 8 (අඩි 20 පළල පාර) සහ බස්නාහිරට : ලොට් 9 සහ එෆ්. ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහක් (A:0, R:0, P:35) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1278 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව B 1093/63 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 1278 දරන පිඹුරේ නිරූපිත ලොට් 8 සහ 9 වශයෙන් ලකුණු කොට ඇති මාර්ග සඳහා වෙන්කිරීම දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-963/1

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ෆ්ලෝරිට් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0061 1000 8757.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.02 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පහළොස් කෝටි හැට හය ලක්ෂ හැට එක් දහස් හත්සිය හැත්තෑ හයයි ශත තිස් නමයක (රු. 156,661,776.39) මුදල ද, 2019 අප්‍රේල් මස 02 වැනි දින සිට අංක 1800 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පහළොස් කෝටියක (රු. 150,000,000) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate of Four Decimal Five Per centum (4.5%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.06.14 වැනි දින රජයේ *ගැසට්* පත්‍රයේ 2019.06.06 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2019.08.27 වැනි දින පෙ.ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තලංගම උතුර අංක A 477 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තලංගම උතුර පිහිටි කරුණාතිලක මාවත (දැන් පයිප් ලයින් පාර යයි කියනු ලබන) වරිපනම් අංක 70/5 දරන "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානත තැන ජී. බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2016 මාර්තු මස 12 දාතම හා අංක 11595 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්. පී. මොරවක යන අය විසින් හිමිකම් කියනු ලබන කහටගමවත්ත, නැගෙනහිරට : එම්. ජී. තිලකරත්න, ගාමිණී විජේරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ දැන් පයිප් ලයින් පාර යයි කියනු ලබන කරුණාතිලක මාවත, දකුණට : දැන් පයිප් ලයින් පාර යයි කියනු ලබන කරුණාතිලක මාවත, ඩී. රෝහණ සෙනවිරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන දෙල්ගහවත්ත (බලයලත් මානක තැන කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2004 ජූලි මස 12 දාතම හා අංක 134/2004 දරන පිඹුරේ ලොට් 5 සහ දැන් එම දාතම හා අංක 11594 දරන පිඹුරේ ලොට් 1) සහ බස්නාහිරට : ඩී. රෝහණ සෙනවිරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන දෙල්ගහවත්ත (බලයලත් මානක තැන කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2004 ජූලි මස 12 දාතම හා අංක 134/2004 දරන පිඹුරේ ලොට් 5 දැන් එම දාතම හා අංක 11594 දරන පිඹුරේ ලොට් 1) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතරයි හයක් (A:0, R:0, P:16.46) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 11595 දරන පිඹුරට අනුවය.

**අංක 11595 දරන පිඹුරේ එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩම්වල ඒකාබද්ධයක් සහ නැවත මිනුමකි :**

එකී තලංගම උතුර පිහිටි "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 අප්‍රේල් මස 15 දාතම හා අංක 094/2007 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්. පී. මොරවක යන අය විසින් හිමිකම් කියනු ලබන දේපළ, නැගෙනහිරට : මෙහි ලොට් 2, දකුණට : පයිප් ලයින් පාර සහ බස්නාහිරට : එරල් ගුණසේකර යන අය විසින් හිමිකම් කියනු ලබන දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙකයි තුනක් (A:0, R:0, P:8.23) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 094/2007 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 895/90 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී තලංගම උතුර පිහිටි "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 අප්‍රේල් මස 15 දාතම හා අංක 094/2007 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්. පී. මොරවක යන අය විසින් හිමිකම් කියනු ලබන දේපළ, අඩි 20 පළල පාර සහ එම්. ජී. තිලකරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන දේපළ, නැගෙනහිරට : ගාමිණී විජේරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන දේපළ සහ පයිප් ලයින් පාර, දකුණට : පයිප් ලයින් පාර සහ බස්නාහිරට : මෙහි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙකයි තුනක් (A:0, R:0, P:8.23) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 094/2007 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 895/91 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තලංගම උතුර අංක A 477 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තලංගම උතුර පිහිටි කරුණාතිලක මාවත (දැන් පයිප් ලයින් පාර යයි කියනු ලබන) වරිපනම් අංක 70/5 දරන "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. බී. දොඩන්වෙල යන අය විසින් සාදන ලද 2016 මාර්තු මස 12 දාතම හා අංක 11594 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එස්. පී. මොරවක යන අය විසින් හිමිකම් කියනු ලබන කහටගමවත්ත, නැගෙනහිරට : එම්. පී. එස්. ජයතිලක යන අය විසින් හිමිකම් කියලු ලබන දෙල්ගහවත්ත (බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 අප්‍රේල් මස 15 දාතම හා අංක 094/2007 දරන පිඹුරේ ලොට් 1 සහ දැන් එම දාතම හා අංක 11594 දරන පිඹුරේ ලොට් 1) සහ දැන් පයිප් ලයින් පාර යයි කියනු ලබන කරුණාතිලක මාවත, දකුණට : දැන් පයිප් ලයින් පාර යයි කියනු ලබන කරුණාතිලක මාවත සහ කානුව සහ බස්නාහිරට : සව්සිරි පාර වරිපනම් අංක 64/10, 64/9, 64/8 සහ 64/7 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හයක් (A:0, R:2, P:6) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 11594 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 1120/50 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-963/2

HNB 21 - 19 (11)

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කතරගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2011.08.23 වැනි දින සහතික කරන ලද අංක 12201, 2016.05.12 වැනි දින සහතික කරන ලද අංක 15459 සහ 2014.06.06 වැනි දින සහතික කරන ලද අංක 14158 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම හේවා ගැටමාන්න ගමගේ මල්ෂා ගයනි ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 19 වැනි දින ප. ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපළ .-** ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල කෝරළේ, දෙටගමුව ග්‍රාම නිලධාරි වසමේ, කතරගම හි පිහිටි දෙටගමුවේයාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 1996.09.04 වැනි දින පිළියෙල කරන ලද අංක 2036 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : එකී පිඹුරේ දැක්වෙන කතරගම සිට වැඩහිටි කන්ද දක්වා දිවෙන මග පෙන්වන පාර මගින් ද, නැගෙනහිරට : එකී පිඹුරේ දැක්වෙන ආර්. එම්. රංජනී විසින් හිමිකම් කියන ඉඩම මගින් ද, දකුණට : එකී පිඹුරේ දැක්වෙන ආර්. එම්. හේරත් විසින් හිමිකම් කියන එම ඉඩමේ ඉතුරු කොටස මගින් ද සහ බස්නාහිරට : එකී පිඹුරේ දැක්වෙන ආර්. එම්. හේරත් විසින් හිමිකම් කියන එම ඉඩමේ ඉතුරු කොටස මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.05.31 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.06.06 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම. - තිස්සමහාරාම සිට කතරගම පාරේ කි. මී. 14ක් ගම් උදව හන්දිය දක්වා පැමිණ එම පාරේ තව දුරටත් කි. මී. 2ක් පමණ පැමිණ පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇති චමිලා ගෙස්ට් හවුස් පසු කර එම පාරේ තව දුරටත් මීටර් 200ක් පමණ ඉදිරියට ගොස් දකුණු පසට ඇති බොරලු පාරේ මීටර් 300ක් පමණ ගිය පසු අදල දේපලට ළඟා විය හැක. එම දේපළ පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500)ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදළ ලේඛන පරික්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. අමතන්න.

දුරකථන අංක : 011 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දෙඩන්දුව.
දුරකතන අංක 091 - 2277105, 0779-663420
ඊමේල් : ejayawardhana77@gmail.com

07-929

---

HNB 19 - 19

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - දෙනියාය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2017.01.01 වැනි දින සහතික කරන ලද අංක 733 සහ 2012.06.01 වැනි දින සහතික කරන ලද අංක 2302 සහ 2015.11.09 වැනි දින සහතික කරන ලද අංක 3562 සහ 2016.10.04 වැනි දින සහතික කරන ලද අංක 3828 සහ 2018.04.18 වැනි දින සහතික කරන ලද අංක 4318 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම සුසිල් බන්දුල ජයසිංහ සහ ශිරංග ලක්ෂාන් ජයසිංහ ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 30 වැනි දින ප. ව. 12.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපළ.-** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, පිටබැද්දර ග්‍රාම නිලධාරි වසමේ, පිටබැද්දර පිහිටි දන්කොළුව නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් 2006.09.18 වැනි දින පිළියෙල කරන ලද අංක 2006/403 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කරන ලද ලොට් අංක 02 ට මායිම් වශයෙන්, ඊසානට : මුරුක්කන් දොල මගින් ද, ගිණිකොණට : එම ඉඩමේ ලොට් 03 මගින් ද, නිරිතට : කොටපොල - අකුරැස්ස පී.ඩබ්ලිව්. ඩී. පාර මගින් ද, වයඹට : කොටපොල - අකුරැස්ස පී. ඩබ්ලිව්. ඩී. පාර සහ එම ඉඩමේ ලොට් 01 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම පහ (අ.00, රූ.00, පර්.17.5) නමුත් වඩාත් නිවැරදිව අංක 2006/403 දරන පිඹුරට අනුව පර්චස් දහසයයි දශම හතරයි හතර (අ.00, රූ.00, පර්.16.44)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග පස සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.05.31 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.06.04 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම. - අකුරැස්ස බස් නැවතුම් පොල සිට මොරවක පාරේ සැතපුම් 12ක් පිටබැද්දර හන්දිය දක්වා ගිය පසු අදල දේපලට ළඟා විය හැක. පාරේ දකුණු අත පැත්තේ ලංකා බැංකුව ඉදිරිපිට අදල දේපල පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද.
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500)ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛණ පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. අමතන්න.

දුරකථන අංක : 011 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව.
දුරකතන අංක 091 - 2277105, 0779-663420
ඊමේල් : ejayawardhana77@gmail.com

07-933

---

HNB 22 - 19

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - දෙනියාය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොරවක ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2016.09.22 වැනි දින සහතික කරන ලද අංක 3816 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම පුංචිහේවගේ කපිල නිශාන්ත ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 30 වැනි දින ප. ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපළ.-** 01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමා තුළ අන්දරදෙණිය ග්‍රාම නිලධාරි වසමේ මතුගොබේ ගමේ අන්දරදෙණිය ගෟප් (FVP 169 තුල ලොට් 704) නමැති ඉඩමේ ලොට් 05හි බලයලත් මිනින්දෝරු කේ. වී. පී. බී. කීර්තිලාල් විසින් 2010.07.27 වැනි දින පිළියෙල කරන ලද අංක 394A දරන පිඹුරේ දැක්වෙන ලොට් 5A හි බලයලත් මිනින්දෝරු ඒ. ජේ. ජයසේකර විසින් 2014.06.06 වැනි දින පිළියෙල කරන ලද අංක 136/2014 දරන පිඹුරේ දැක්වෙන බෙදා ඒකාබද්ධ කරන ලද සහ යාබද ලොට් B, E, F සහ G දරන කොටස් වලට මායිම් වශයෙන්, උතුරට : අංක 136 දරන පිඹුරේ ලොට් A සහ අංක 136/2014 දරන පිඹුරේ ලොට් D මගින් ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 04 සහ අංක 394A දරන පිඹුරේ ලොට් 5B මගින් ද, දකුණට : දෙණියාය - විහාරහේන පාර සහ අංක 394A දරන පිඹුරේ ලොට් 5B මගින් ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 02 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර දහයයි රූඩ් දෙකයි පර්චස් දහ අටයි දශම තුනයි හතර (අ.10, රූ.02, පර්.18.34)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග පස සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

02. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමා තුළ අන්දරදෙනිය ග්‍රාම නිලධාරි වසමේ මතුගොබේ ගමේ අන්දරදෙණිය ගෟප් (FVP 169 තුළ ලොට් 704) නමැති ඉඩමේ ලොට් 05හි බලයලත් මිනින්දෝරු කේ. වී. පී. බී. කීර්තිලාල් විසින් 2017.07.27 වැනි දින පිළියෙල කරන ලද අංක 394A දරන පිඹුරේ දැක්වෙන ලොට් 5A හි බලයලත් මිනින්දෝරු ඒ. ජේ. ජයසේකර විසින් 2014.06.06 වැනි දින පිළියෙල කරන ලද අංක 136/2014 දරන පිඹුරේ දැක්වෙන බෙදා දක්වන ලද ලොට් C දරන කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 136 දරන පිඹුරේ ලොට් A මගින් ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 04 මගින් ද, දකුණට : අංක 136/2004 දරන පිඹුරේ ලොට් D (පාර) මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම හයයි හයක (අ. 0, රූ. 0, පර්. 3.66) විශාලත්වයෙන් වූ ත්‍රිකෝණාකාර ඉඩම සමග පස සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

ඉහත කී අංක 136/2014 දරන පිඹුරේ දැක්වෙන ලොට් D මතින් සහ දිගේ මාර්ගය සහ සියලුම අනෙකුත් සම්බන්ධිත අයිතීන් හි අයිතිය සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.05.31 වැනි දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.06.10 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම. - දෙනියාය අන්දරදෙනිය පාරේ (විහාරහේන හරහා) අන්දරදෙනිය පැක්ටරිය හන්දිය දක්වා ගොස් දකුණු පසට ඇති ගමට යන පාරේ මීටර් 300ක් පමණ ගිය පසු අදාල දේපළ පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛණ පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10. අමතන්න.

දුරකථන අංක : 011 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව.
දුරකතන අංක 091 - 2277105, 0779-663420
ඊමේල් : ejayawardhana77@gmail.com

07-928

---

HNB 20 - 19 (1)

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - දෙනියාය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2011.01.13 වැනි දින සහතික කරන ලද අංක 1678, 2011.07.06 වැනි දින සහතික කරන ලද අංක 1901, 2013.01.21 දින සහතික කරන ලද අංක 2554, 2015.06.19 වැනි දින සහතික කරන ලද අංක 3438, 2016.06.06 වැනි දින සහතික කරන ලද 3713 සහ 2016.12.29 වැනි දින සහතික කරන ලද අංක 3914 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එස්. ආර්. කන්ස්ට්‍රක්ෂන්ස් තනි පුද්ගල ව්‍යාපාරයේ අයිතිකරු සුසිර රණවීර ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 21 වැනි දින ප. ව. 12.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපළ .-** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, බටහිර මොරවක් කෝරළේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඌවරගල ග්‍රාම නිලධාරි වසමේ, ඌවරගල හි F. V. P. 11 තුළ පිහිටි ලොට් අංක 36 ලෙස දැක්වෙන පොල්ගස්තැන්නහේන නමැති ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 1P සහ T.P. 398800 මගින් ද, නැගෙනහිරට : හොරගල ගම් සීමාව මගින් ද, දකුණට : D. R 3873 පාර සඳහා වෙන්කිරීම මගින් ද, බස්නාහිරට : ලොට් අංක 48 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව අක්කර පහළොවයි රූඩ් දෙකයි පර්චස් හයක (අ.15, රූ.02, පර්.06) විශාලත්වයෙන් වූ ඉඩම සමග පස සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ මහතා විසින් 2000.06.06 වැනි දින පිළියෙල කරන ලද අංක 168/00 දරන පිඹුරෙන් මෙම ඉඩම නැවත මැන ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.05.31 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.06.04 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම. - දෙනියාය බස් නැවතුම් පොල සිට මොරවක පාරේ සැතපුම් 10ක් පමණ වරල්ල දක්වා ගොස් යාපා මාවතෙන් වමට හැරී යාර 10ක් පමණ ගොස් දකුණට හැරී වතු පාරේ සැතපුම් 04ක් පමණ ගිය පසු අදාළ දේපළට ළඟා විය හැක. මෙම දේපළ මාර්ගය දෙපස පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද.
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500)ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛණ පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. අමතන්න.

දුරකථන අංක : 011 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව.
දුරකතන අංක 091 - 2277105, 0779-663420
ඊමේල් : ejayawardhana77@gmail.com

07-932

---

HNB 20 - 19 (11)

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - දෙනියාය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද 2013.08.15 වැනි දින සහතික කරන ලද අංක 2752, 2014.05.21 වැනි දින සහතික කරන ලද අංක 3059, 2015.06.19 වැනි දින සහතික කරන ලද අංක 3439 සහ 2017.08.08 වැනි දින සහතික කරන ලද අංක 4102 දරන බැදුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම එස්. ආර්. කන්ස්ට්‍රක්ෂන්ස් තනි පුද්ගල ව්‍යාපාරයේ අයිතිකරු සුසිර රණවීර ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැදුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2019ක් වූ අගෝස්තු මස 21 වැනි දින ප. ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපළ.-** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ, කොටපොල දකුණ ග්‍රාම නිලධාරි වසමේ කොටපොල ගමේ පිහිටි කැවිල්ලේමුල්ල වත්ත නමැති ඉඩමට

බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් 1995.10.23 වැනි දින පිළියෙල කරන ලද අංක 423/95 දරන පිඹුරේ දැක්වෙන බෙදා දක්වන ලද ලොට් අංක 01ට මායිම් වශයෙන්, උතුරට සහ නැගෙනහිරට : ජේ. විජේසිංහ විසින් හිමිකම් කියන බැද්ද හෙවත් කැබිල්ලේමුල්ලේ වත්ත මගින් ද, දකුණට : අංක 423/95 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 02 මගින් ද, බස්නාහිරට : දෙනියාය - මොරවක ප්‍රධාන පාර මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් පහක (අ. 0, රූ. 01, පර්. 05) විශාලත්වයෙන් වූ ඉඩම සමග පස සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් 2006.09.04 වැනි දින පිළියෙල කරන ලද අංක 6/212 දරන පිඹුරෙන් මෙම ඉඩම නැවත මැන ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.05.31 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.06.04 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම. - අකුරැස්ස දෙනියාය පාරේ ගල්දොල 69 වන කිලෝමීටර් කණුව දක්වා පැමිණි පසු අදාල දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10. අමතන්න.

දුරකථන අංක : 011 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව.
දුරකතන අංක 091 - 2277105, 0779-663420
ඊමේල් : ejayawardhana77@gmail.com

07-931

---

HNB 21 - 19 (1)

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කතරගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2012.05.15 වැනි දින සහතික කරන ලද අංක : 12857 සහ 2016.11.07 වැනි දින සහතික කරන ලද අංක 15772 දරන බැදුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම හේවා ගැටමාන්න ගමගේ මල්ෂා ගයනි ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැදුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 19 වැනි දින ප. ව. 12.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපළ.-** ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල කෝරළේ, කතරගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත සෙල්ලකතරගම ග්‍රාම නිලධාරි වසම ඇතුළත කොහොඹදිගන හී පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් 2005.08.26 වැනි දින පිළියෙල කරන ලද අංක 786 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට සහ නැගෙනහිරට : ලොට් 2 (පාරට වෙන්කිරීම) මගින් ද, දකුණට : පාරට වෙන්කිරීම සහ එම ඉඩමේ කොටසක් (ඩබ්. ඒ. සිරිපාල විසින් හිමිකම් ලත් ඉඩම) සහ පී. කේ. ආතර් විසින් හිමිකම් කියන ඉඩම මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව හෙක්ටයාර් 0.202 ක හෙවත් රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.05.31 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.06.06 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම. - කතරගම ගම්උදාව මකර තොරණ සිට රජ මාවත දිගේ කි. මි. 7.5ක් සෙල්ල කතරගම කඩපොල දක්වා පැමිණ වම් දෙසට ඇති කොහොඹ දිගන පාරේ මීටර් 400ක් පමණ ලක්ෂ්මී දෙවොල භූමිය දක්වා පැමිණ එම පාරේ තවදුරටත් මීටර් 600ක් පමණ ඉදිරියට යන විට හමුවන තුංමන්හන්දියෙන් වම්දෙසට ඇති ප්‍රාදේශීය සභා බොරළු පාරේ මීටර් කිපයක් ඉදිරියට යන විට අදාල දේපලට ළඟා විය හැක. මෙම දේපොල පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද.
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500)ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ඇතුළ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛණ පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10. අමතන්න.

දුරකථන අංක : 011 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දෙඩන්දූව.
දුරකතන අංක : 091 - 2277105, 0779-663420.
ඊමේල් : ejayawardhana77@gmail.com

07-930

---

HNB 23 - 19

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මොණරාගල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද 2013.09.25 වැනි දින සහතික කරන ලද අංක 1921 සහ 2014.04.10 වැනි දින සහතික කරන ලද අංක 2143 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම දිසානායක මුදියන්සේලාගේ පුබුදු සමරසේකර ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ වර්ෂ 2019ක් වූ අගෝස්තු මස 26 වැනි දින ප. ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ .- ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත මොණරාගල කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ, 129 මොණරාගල නගර ග්‍රාම නිලධාරි වසමේ, මුප්පනේ ගමේ පිහිටි "බකිනිකොටුවේහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් 2004.07.18 වැනි දින පිළියෙළ කරන ලද අංක 2298 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම්. එස්. සින්නයියා විසින් හිමිකම්ලත් ඉඩම සහ බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල්, මහතා විසින් 1972.12.09 වැනි දින පිළියෙළ කරන ලද අංක 540 දරන පිඹුරේ ලොට් 2 මගින් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. එෆ්. ඉස්මයිල්, විසින් 1972.12.09 වැනි දින පිළියෙළ කරන ලද අංක 540 දරන පිඹුරේ ලොට් 2 මගින් ද, දකුණට : ප්‍රධාන පාර දිගේ වෙන්කිරීම, ලොට් 2 සහ ඩී. එම්. වීරසිංහ සහ රසික සමරසේකර විසින් හිමිකම් ලත් ඉඩම මගින් ද සහ බස්නාහිරට : රසික සමරසේකර සහ එම්. එස්. සින්නයියා විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද මායිම් වූ ටී. බී. අත්තනායක විසින් 2004.07.18 වැනි දින පිළියෙළ කරන ලද එකී අංක 2298 දරන පිඹුර ප්‍රකාරව රූඩ් තුනයි පර්චස් දෙකක (අ. 0, රූ.03, පර්. 2) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.05.31 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.06.10 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම. - මොණරාගල නගරයේ සිට වැල්ලවාය පාරේ මීටර් 500ක් පමණ ගමන් කර තානායම් හන්දිය පසු කර අදාළ දේපළට ළඟා විය හැක. මෙම දේපල ප්‍රධාන මාර්ගයට මුහුණලා දකුණු අත පැත්තේ සිල්වා ගෙස්ට් හවුස් අසල පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද.
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැනුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 අමතන්න.
දුරකථන අංක : 011 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව.
දුරකතන අංක 091 - 2277105, 0779-663420.
ඊමේල් : ejayawardhana77@gmail.com

07-927

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, (කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, අදිකාරි පත්තුවේ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 503 සී, මල්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත මුල්ලේරියාව උතුරේ පිහිටි උඩුමුල්ල පාරේ, වරිපනම් අංක 10 ඒ දරන එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ඇතුළු සියලු දේ සමග වන ''හික්ගහවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන (බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද වර්ෂ 1987 ක් වූ මැයි මස 21 වැනි දිනැති අංක 2223 දරන පිඹුරේ නිරූපිත පවත්නා මායිම් අනුව නැවත මැනීමක් වන) බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව විසින් සාදන ලද වර්ෂ 2016 ක් වූ ජුනි මස 16 වැනි දිනැති අංක 5772 දරන පිඹුරේ ලොට් 1 දරන ඉඩම් කොටස වේ.

(බිම් ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 15)
වර්ෂ 2019 ක්වූ අගෝස්තු මස 19 වැනි දින පෙ. ව. 9.00 ට

දේපළට පිවිසෙන මාර්ගය. - ඔරුගොඩවත්තේ සිට අවිස්සාවේල්ල පාර දිගේ ගල්වාන හන්දිය තෙක් කි. මී. 6.5ක් පමණ ගොස් දකුණට ඇති උඩුමුල්ල පාරට හැරී මීටර් 75ක් පමණ ගිය විට දකුණු පසින් වන්නට අදාළ දේපළ පිහිටා ඇත.

කහදෙනි පතිරන්නැහැලාගේ කසුන් සාගර කුලතුංග බන්ධනදායී වශයෙන් ද සහ අහංගම ලියනගේ බන්දුල උකස්කරු බන්ධනදායී වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජී. ශානිකා අනුරාධි විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.07.21 දිනැති අංක 32 සහ වර්ෂ 2017.04.07 දිනැති අංක 161 දරන උකස් බැඳුම්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2018.07.04 වැනි දින දි අයිලන්ඩ්, දිවයින, තිනක්කුරල් පුවත්පත් සහ වර්ෂ 2018.07.13 වැනි දින ගැසට් පත ද බලන්න.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැනුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමනාකරු - ණය අයකර ගැනීම් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011- 4667412.

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකතන අංක : 011-3068185 ෆැක්ස් අංක : 011- 2572940.

07-907

---

**සෙලාන් බැංකුව පීඑල්සී - බගවන්තලාව ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ බගවන්තලාව පදිංචි බාලක්‍රිෂ්ණන් සිවනේසන් යන අය බන්ධනදයී/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ උඩබුලත්ගම අඹගමුව කෝරළේ, අඹගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ අඹගමුව ලේකම් කාර්යාල කොට්ඨාසයේ, බගවන්තලාව දකුණ අංක 319 එෆ් ග්‍රාම නිලධාරි කොට්ඨාසය තළ බගවන්තලාව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2001 සැප්තැම්බර් මස 29 දිනැති අංක 10194 දරන සැලැස්මේ නිරූපණය වන බගවන්තලාව, මහ වීදිය, වරිපනම් අංක 22 දරන ලොට් 1 ලෙස ලකුණු කළ (ඉහත කී අංක 10194 සැලැස්මේ 2013 ජුනි මස 30 වැනි දින බලයලත් මිනින්දෝරු සුමංගලී සුබ්‍රමනියම් විසින් සහතික කරන ලද සටහන අනුව අදළ දේපලෙහි ප්‍රමාණය සහ මායිම් එහි සඳහන් මුල් ප්‍රමාණය ම බව තහවුරු විය.) බෙද වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දෙකයි දශම තුනයි හතක් (අ. 0, රූ. 0, පර්. 02.37) විශාල ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2019 අගෝස්තු මස 23 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - බගවන්තලාව සෙලාන් බැංකුව පරිශ්‍රයේ සිට නෝවුඩ් පාර ඔස්සේ මීටර් 100 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා ඇත. (බ්‍රිඩ්වෙල් පාර මංසන්ධියට මීටර් 20 කට පමණ පෙර)

යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2019.05.10 වැනි දින පළ වී ඇති අතර, අද, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත්වල 2019.05.10 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මුදලෙන් 10% ද (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456465, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011- 2572940.

07-904

### සෙලාන් බැංකුව පීඑල්සී - මොණරාගල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ ඔක්කම්පිටිය පදිංචි රත්නායක මුදියන්සේලාගේ ජයරත්න සහ රාජපක්ෂ මුදියන්සේලාගේ මාලනී රාජපක්ෂ යන අය බන්ධනදයී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුත්තල වැදිරට කෝරළේ, ඔක්කම්පිටිය 145 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඔක්කම්පිටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු සුදන්ත රත්නායක විසින් සාදන ලද 2015.01.17 දිනැති අංක 1290 සැලැස්මේ ලොට් 1 ලෙස ලකුණු කළ පනුලන්දේයාය (බෙදන ලද බස්නාහිර කොටස) නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0 රූ. 01, පර්. 20) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග සහ මාර්ග ප්‍රවේශය පාවිච්චි කිරීමේ අයිතිය ද සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2019 අගෝස්තු මස 15 වැනි දින පස්වරු 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම. - බුත්තල නගරයේ සිට ඔක්කම්පිටිය පාර ඔස්සේ කි. මී. 6.2 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම් පසින් පිහිටා ඇත. (6 වන කි. මී. කණුවට මීටර් 200 කට පමණ පසුව)

යෝජනා සම්මුති දැන්වීම. - රජයේ ගැසට් පත්‍රයේ 2019.04.26 වැනි දින පළ වී ඇති අතර, අද, ඩේලි එක්ස්ප්‍රස් සහ තිනක්කුරල් පුවත්පත්වල 2019.05.09 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ද (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නෙගෙවීමට සහ නැවත එම දේපළ විකිණීම බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456491, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011- 2572940.

07-903

---

### සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ ගාල්ල පදිංචි කොඩිතුවක්කු ආරච්චිගේ රාජනී ලංකා යන අය බන්ධනදයී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ දංගෙදර වැලිවත්ත, 97 ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැලිවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු යූ. වේවැල්වල විසින් සාදන ලද 2014.07.21 දිනැති අංක 2186 දරන සැලැස්මේ නිරූපණය වන දෙමහල් ගොඩනැගිල්ල සමග සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ශ්‍රී සරණංකර පාර, වරිපනම් අංක 29 දරන මීගහවත්ත හෙවත් ජම්බුගෙ ාඩවත්ත ලොට් 1 සහ වීදුරුමුල්ලේ වත්ත ලොට් 2 හි වෙන් කළ 1/4 වැනි කොටස නමැති යාව පිහිටි එකතු කළ ඉඩම්වල ලොට් සී ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහයයි දශම හයක් (අ. 0 රූ. 0 පර්. 10.6) නොහොත් හෙක්ටයාර 0.0268 ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2019 අගෝස්තු මස 20 වැනි දින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම. - ගාල්ල නගර මධ්‍යයේ සිට දංගෙදර මංසන්ධිය දක්වා පැමිණ වැලිවත්ත පාරට පිවිස තවත් යාර 200 ක පමණ දුරක් යන විට ඇති ඕල්කට් මධ්‍ය මහා විද්‍යාලය පසුකර වම්පසට ඇති සරණංකර පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 150 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - රජයේ ගැසට් පත්‍රයේ 2018.06.22 වැනි දින පළ වී ඇති අතර, දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත්වල 2018.06.12 වැනි දින ද තිනක්කුරල් පුවත්පතේ 2018.06.12 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ද (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7.ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නෙගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නීති ප්‍රධානි, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක : 011- 2456481, 2456491.
ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක 011-3068185 ෆැක්ස් අංක 011- 2572940.

07-902

---

### සෙලාන් බැංකුව පීඑල්සී - කඩවත ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ කොළඹ 04, පදිංචි නානායක්කාරවසම් එගොඩගේ ඉනෝකා සෙව්වන්දි යන අය බන්ධනදයි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සියනෑ කෝරළේ, රාගම පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගලහිටියාව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 2009.09.08 දිනැති අංක 16315 දරන සැලැස්මේ නිරූපණය වන කජුගහලන්ද නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහතුනයි දශම හතයි පහක් (අ. 0 රූ. 0 පර්. 13.75) විශාල ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලුම දේ සමග ඉඩම.

අංක 11/2010 සැලැස්මේ නිරූපණය වන ලොට් 8 ලකුණු කළ ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ඉහත සඳහන් දේපළ 2019 අගෝස්තු මස 16 වැනි දින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - ගනේමුල්ල දුම්රිය හරස් මාර්ගය අසළ සිට කඩවත - කිරිදිවිට මාර්ගය ඔස්සේ කිරිදිවිට දෙසට මීටර් 200 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2018.06.22 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.06.13 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.06.13 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ද (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7.ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති) සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456465, 2456472.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක 011-3068185, 011- 2572940.

07-905

---

### හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - වත්තල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ බම්බලපිටිය පිහිටි බම්බලපිටිය පාරේ, තක්සේරු අංක 40 දරන, අංක 2728 දරන පිඹුරෙහි සියල්ල බෙදා වෙන්කර සහ සීමා නිර්ණය කොට ඇති, ලොට් අංක 01 ලෙස සඳහන් එහි ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දෑ, ඉහත කී ලොට් අංක 01 ලෙස සඳහන් එහි ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දෑ, ඉහත කී ලොට් අංක 01, උතුරින් තක්සේරු අංක 36 දරන පරිශ්‍රය, නැගෙනහිර ගාළු පාරට, දකුණින් ලොට් අංක 02 සහ බටහිරින් තක්සේරු අංක 48 දරන පරිශ්‍රය, ගාළු පාර සහ පර්චස් 11, 1977.02.21 වැනි දින බලයලත් තක්සේරුකරු එස්. ආර්. යාපා විසින් සකසන ලද පිඹුරු අංක 2728.

ඉහත සඳහන් දේපළ, මෑතක දී තක්සේරු කර 2002,10.08 වැනි දින දරන, පිඹුර අංක 5216/X නිරූපණය වන පරිදි බලයලත් තක්සේරුකරු එස්. ලෝකනාදන් විසින් තක්සේරු කර, පහත පරිදි විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ බම්බලපිටිය පිහිටි බම්බලපිටිය පාරේ, තක්සේරු අංක 40 දරන අංක 5216/X දරන පිඹුරෙහි, සියල්ල බෙදා වෙන්කර සහ සීමා නිර්ණය කොට ඇති, ලොට් අංක 01 ලෙස සඳහන් එහි ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ, ඉහත කී ලොට් අංක 01 උතුරින් තක්සේරු අංක 36 දරන පරිශ්‍රය (බම්බලපිටිය පාර) නැගෙනහිරින් ගාළු පාර, දකුණින් තක්සේරු අංක 42 දරන පරිශ්‍රය (බම්බලපිටිය පාර) පෙර කී පිඹුරු අංක 5216/X අනුව, තිට්ටලපිටිගේ දිනුක ජයමාල් අර්නස්ට් ෆොන්සේකා සහ පරවිතානගේ දුලානි නිසන්සලා දිනේෂිකා ෆොන්සේකා යන අයට හිමිකර දී ඇති ණය පහසුකම් ලෙස, හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. යට උකස් කර ඇති දේපළ, 2011 ජුනි 09 වැනි දින දරන බැඳුම්කර අංක 4690 සහ 2016 සැප්තැම්බර් මස 23 වැනි දින දරන බැදුම්කර අංක 6651 මත ණයගැතියා ලෙස උකස් කර ඇති බවට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කර ඇත.

ඉහත දේපළ 2019 අගෝස්තු 16 වැනි සිකුරාද දින පෙ. ව. 10.30 ට ආරම්භ වී පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉඩමට ප්‍රවේශය .- ගාලු පාරේ සිට බම්බලපිටිය හන්දිය දක්වා ගොස් මීටර් 50ක් පමණ දකුණට ගොස්, මැජස්ටික්සිටි, යුනිටි ප්ලාසා, ශාන්ත ඇල්බන්ස් පෙදෙස පසු කර බම්බලපිටිය පොලිස් ස්ථානයේ පිවිසුමට ළඟාවීමට පෙර, මුහුද පැත්තට, මෙම දේපළ ගාළු පාරේ, දකුණු පසින් පිහිටා ඇත. බම්බලපිටිය මාර්ගය දැන් එක් දෙසකට දිවෙන මාර්ගයකි. මෙම දේපළ බම්බලපිටිය පොලිස් ස්ථානයට පසුව පාරේ වම් පසින් පිහිටා ඇත.

යෝජනාව පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2018 මැයි 18 වැනි දින පළවූ රජයේ ගැසට් පත්‍රය සහ 2018 ජුනි 11 වැනි දින පළවූ ඩේලි මිරර්, ලක්බිම සහ තිනකුරල් යන පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක වූ ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් ප්‍රමාණයන් මිටිය පහත හෙළීම සමගම ගෙවිය යුතු වේ :

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් පාලන බලධරයා වෙත ගෙවිය යුතු පළාත් විකිණීමේ බද්ද වශයෙන් 1% ක මුදලක් (සියයට එකක්),
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ඇතිනම්,
6. විකිණීමේ සහතිකය සඳහා වූ මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල් සහ ශ්‍රී ලංකා ආණ්ඩුවට හෝ වෙනත් බලධාරියා විසින් අදාලවන අවස්ථාවල දී නියම කරනු ලබන ව්‍යවස්ථානුකූල අයකිරීම්, තීරුබද්ධ, බද්ධ හෙවත් ගාස්තු, විකිණීමේ දිනයේ සිට දවස් තිහක් ඇතුළත ගෙවිය යුතු වේ. ඉඩම් ඔප්පු සහ අනෙකුත් ලියවිලි සඳහා සා. සා. ක. - අය කිරීම්, හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661816, ෆැක්ස් අංකය : 011 - 2661835.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා උද්‍යානය, පිට දුටුගැමුණු වීදිය, කොහුවල.
දුරකථන අංක : 011 4367467, 114367111.
aucslk@gmail.com

07-845

---

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුද දිනට පෙර දැනුම් දිය යුතුය.**

I කොටස : I ඡෙදය යටතේ පළවන දැන්වීම් සහ I කොටස : (IIආ) ඡෙදයේ වෙන්දේසි කිරීම් යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2019.07.26 දින ගැසට් පත්‍රයේ පළවේ.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk